www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාව: ස්ටැලින්වාදී සීපීඑම් පක්ෂය රතු කොඩි වනමින් ම තවදුර දකුනට යයි

## India: While waving red-flags, the Stalinist CPM lurches further right

**අරුන් කුමාර් විසිනි**
**2008 අප්‍රේල් 5**

ඉන්දියාවේ ප්‍රධානතම ස්ටැලින්වාදී පක්ෂය සහ වාම පෙරමුනේ මුඛ්‍ය හවුල්කරුවා වන ඉන්දියානු මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය හෙවත් සීපීඑම් එහි 19 වන ජාතික සමුලුව අප්‍රේල් 3වන බ්‍රහස්පතින්දා දින සමාප්ත කලේ ය.

සීපීඑම්-නීත වාම පෙරමුන 2004 වසරේ මැයි මාසයේ සිට ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සංධාන (යූපීඒ) සභාග ආන්ඩුවට බලයේ රැඳී සිටීමට "පිටත සිට" මුක්කුව දී ඇත. ඉන්දියානු ධනේශ්වරයේ සාම්ප්‍රදායික පාලක පක්ෂය වන කොංග්‍රස් පක්ෂය නායකත්වය දරන යූපීඒ ආන්ඩුව, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග " මූලෝපායික හා ගෝලීය සබඳතාවක්" සහතික කර ගැනීමේ මංපෙත් සොයන අතර ම ලෝක ධනේශවර වෙලඳපොල සඳහා ලාභ ශ්‍රම නිෂපාදනයේ කේන්ද්‍රස්ථානයක් බවට ඉන්දියාව පත්කිරීම ඉලක්ක කරගත් නව-ලිබරල් ප්‍රතිපත්ති සමගින් ඉදිරියට ගොස් ඇත.

සීපීඑම් ක්‍රියාකාරිකයෝ, පක්ෂ සමුලුව පැවැත්වූ දකුනු ඉන්දියානු රෙදිපිලි නිෂ්පාදනයේ කේන්ද්‍රස්ථානය වන කොයිම්බතෝර්හි ප්‍රධාන මංසන්ධිවල මාක්ස්, එංගල්ස් හා ලෙනින්ගේ රක්ත වර්න රැලිපාලම් හා පොස්ටර් ගොඩ නැංවූහ. සය-දින සම්මේලනය පැවති ශ්‍රවනාගාරයට සීපීඑම් නියෝජිතයන් රැස්වෙද්දී, " ලෝකයේ කම්කරුවනි එක්වව්" යනුවෙන් සඳහන් වූ රතු ධජ සහ සුවිසල් බැනර ඔවුන්ට සුභ පැතී ය.

මේ සියල්ල ව්‍යාජ අලංකාරයකට වැඩි දෙයක් නො වේ. රතු කොඩි වැනීම සහ අනෙකුත් විවිධ පුහු " විප්ලවවාදී" චාරිත්‍රවල අර්ථය වන්නේ ඉන්දියාවේ ධනේශ්වර පාලනයට මුක්කුව දීමේ දී සීපීඑම් ඉටුකරන මුලික ක්‍රියාකලාපය පිලිබඳව අවධානය යොමුවීම වැලැක්වීම යි.

සීපීඑම් පක්ෂය හුදෙක් කම්කරු පන්තිය දක්ෂිනාංශක යූපීඒ ආන්ඩුවට ගැටගසනවා පමනක් නො වේ. වාම පෙරමුන ආන්ඩු බලය දරන බටහිර බෙංගාලය, කේරලය සහ ත්‍රිපුර යන ප්‍රාන්ත තුන තුල ගෙවීන් තම ඉඩම් විශේෂ ආර්ථික කලාප සඳහා විරෝධය පෑම මැඩීමට රුදුරු ප්‍රචන්ඩත්වය යෙදීම ඇතුලු ආයෝජක-හිතවාදී පිලිවෙත් විලිලජ්ජා රහිතව ක්‍රියාවේ යොදවමින් සිටී.

සීපීඑම් සමුලුවට ඉහල මාධ්‍ය සහභාගිත්වයක් ලැබිනි. මෙය සරලව ම සීපීඑම් ජාතික පාර්ලිමේන්තුව තුල තෙවන විශාලතම කන්ඩායමට නායකත්වය දීම නිසා පමනක් නොව ඊට අමතරව කොංග්‍රස් පක්ෂ නායකත්වය වැඩිකල් නො ගොස් ම සීපීඑම් සහ එහි වාම සහචරයන් නො තකා ඉන්දු-එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ඉදිරියට යනු ඇතැයි යනුවෙන් පවතින වැඩෙන මාධ්‍ය ගනන් බැලීම් ද හේතුවෙනි.

සීපීඑම් සමුලුවට පක්ෂ නායකත්වය ඉදිරිපත් කල දේශපාලන යෝජනාවේ එහි ප්‍රාර්ථනාව සහ අභිලාෂය වන්නේ යූපීඒ ආන්ඩුවට එහි සමස්ත පස් අවුරුදු කාලසීමාව ම බලයේ සිටීමට උදව් දීම බව පැහැදිලි කලේ ය. නියමිත කලට පෙර මැතිවරනයක් පැවැත්වෙයි නම් එසේ වනු ඇත්තේ වාම පෙරමුනේ පටන් හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) දක්වා පාර්ලිමේන්තුවේ බහුතරයක විරුද්ධත්වය මධ්‍යයේ න්‍යෂ්ටික ගිවිසුම කරා ඉදිරියට යාමට කොංග්‍රස් පක්ෂය තීරනය කොට ඇති නිසා ය.

සීපීඑම් සමුලුවේ දෙවන දින පැවති මාධ්‍ය හමුවක දී දේශපාලන මන්ඩල සභික සිතාරම් යෙචුරි තම පක්ෂය යූපීඒ ආන්ඩුවට දෙන සහයෝගය අවධාරනය කොට සිටියේ ය. "වර්ගෝත්තමවාදී බලවේග රාජ්‍ය බලයෙන් ඉවත් කොට තැබීම සඳහා අපි යූපීඒට සහය දෙන්නෙමු," යයි යෙචුරි පැවසී ය.

පසුව නගන ලද ප්‍රශ්නයකට උත්තර දෙමින් "ප්‍රධාන සතුරා" වන බීජේපීයට වඩා "අඩු නපුර" වන බැවින් කොංග්‍රස් පක්ෂයට බලයේ සිටීමට සහයෝගය දිය යුතු ය යන ස්ටැලින්වාදී ආස්ථානය යෙචුරි විසින් විස්තාරනය කරනු ලැබී ය: "අපගේ ප්‍රතිපත්තිය වන්නේ කොංග්‍රස් නො වන අතර ම බීජේපී විරෝධී වීම යි. වර්ගෝත්තමවාදය රටෙහි අඛන්ඩතාවට සහ සමගියට විශාල තර්ජනයක් යයි සිතන අපි කොංග්‍රසයට සහ බීජේපීයට සමදුරින් සිටීමේ ආස්ථානයට සම්මාදම් නො වෙමු."

කෙසේවෙතත් ලෝක ධනේශ්වර ආර්ථිකයට ඉන්දියාවේ ඒකාග්‍රවීම වෙනුවෙන් 1991 දී ඉන්දියානු ධනේශ්වරය රාජ්‍ය-නීත සංවර්ධනය අත්හැර දැමූ තැන් පටන් සැබෑ කැලරි පරිභෝජනය පහල වැටී ඇති කම්කරු පන්තිය සහ ග්‍රාමීය ජනතාව වෙතින් යූපීඒ ආන්ඩුවට එල්ලවන වැඩෙන විරෝධය සීපීඑම් නායකත්වයට නො තකා හැරිය නො හැකි ය.

හැම්මේ ඉහල යන ආහාර මිලට එරෙහිව විරෝධතා පැවැත්වීමේ සැලසුම් සීපීඑම් මගින් නිවේදනය කෙරුන ද ඒ සියල්ල යූපීඒ ආන්ඩුවට "ජනතා හිතවාදී" ප්‍රතිපත්ති ක්‍රියාවට දැමීමට බලපෑම දැමීමේ රාමුව තුල පමනි.

කොංග්‍රසයට සහ බීජේපීයට "තෙවන විකල්පයක්" ගොඩනැගීම සඳහා තමන් චිරකාලීනව ඉදිරිපත් කරන ආයාචනය මත වඩා වැඩි අවධාරනයක් යෙදීමට ද සීපීඑම් සමුලුව අමතක නො කලේ ය. "වර්තමාන ආන්ඩුවේ නව-ලිබරල්වාදී ගමන් මාවතට මෙන් ම ඉන්දියාව, එක්සත් ජනපදය සමග මූලෝපායික සංධානයක් කරා රැගෙන යාමට එය දරන ආයාසයන්ට ද එරෙහිව පුලුල් අසහනයක් පවතී. එම නිසා වැදගත් දේශපාලනික කාරනය වන්නේ විකල්ප ආර්ථික හා දේශපාලනික පිලිවෙත් මත පදනම් වූ තුන් වන විකල්පයක් ගොඩ නැංවීම යි. කොංග්‍රස් නො වන බීජේපී විරෝධී දේශපාලන විකල්පයක් සඳහා අපි කටයුතු කරමු," යයි යෙචූරි පැවසී ය.

"වර්ගෝත්තමවාදී බලවේගවලට එරෙහි සම්මුති විරහිත විරුද්ධත්වය," ජනතා විරෝධී ආර්ථික ප්‍රතිසංස්කරනවලට විරුද්ධත්වය සහ ඉන්දියාව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ යටත් සහචරයෙක් බවට පත්කරීමට විරුද්ධත්වය යන තීරනාත්මක ගැටලු තුන පිලිබඳ මූලධර්මාත්මක එකඟත්වය මත මෙම තුන් වන විකල්පය පදනම් වනු ඇතැයි ස්ටැලින්වාදියෝ කියා සිටිති.

"තුන් වන පෙරමුනක් හා තුන් වන විකල්පයක් අතර වෙනසක් පවතී," යයි යෙචූරි පැවසී ය. තුන් වන පෙරමුනක් "හුදෙක් කපා ඇලවීමක්" වන අතර "තුන් වන විකල්පයක් නිශ්චිත ප්‍රතිපත්තිමය පියවර මත පදනම් වනු ඇත."

සීපීඑම් පක්ෂය "තුන් වන පෙරමුන" යන යෙදුම භාවිතා කිරීමට මැලිකමක් දක්වන්නේ බොහෝකොට එම පක්ෂයේ දේශපාලන නායකත්වය සහිතව එවැනි සංයෝජනයක් සඳහා දැනට ම ත් උත්සාහයක් දරා තිබීම යි. 1996 සිට 1998 දක්වා "තුන් වන" හෝ එක්සත් පෙරමුනක් ඉන්දියාව ආන්ඩු කලේ සීපීඑම් "පිටත සිට සහයෝගය" ලබා දුන් තතු තුල ය. එම ආන්ඩුව එහි කොංග්‍රස් පක්ෂ පූර්වගාමියාගේ නව-ලිබරල් ප්‍රතිසංස්කරන දිගට ම ක්‍රියාවේ යෙදවූයේ 1998 මාර්තු මාසයේ දී බහු-පක්ෂ සභාගයක නායකයා ලෙස බීජේපීයට බලයට ඒමට දොර විවර කරමිනි.

පුරාජේරු දොඩවමින් සීපීඑම් ඇත්ත වසයෙන් ම යෝජනා කරන්නේ ප්‍රදේශ හා කුල මත පදනම් වූ විවිධාකාර ධනේශ්වර පක්ෂවල මැතිවරන සංධානයකි. මේවායින් බොහෝ පක්ෂ පූර්ව තුන් වන පෙරමුනේ සාමාජිකයින්ව සිට ඇති අතර ඒ සියල්ලෝ ම ඉන්දියානු ධනේශ්වරයේ ආර්ථික "ප්‍රතිසංස්කරන" වැඩපිලිවෙලේ සහායකයෝ ය. සීපීඑම් දැනට ම ත් ආන්ද්‍රා ප්‍රදේශය මත පදනම් වන, තුන් වන පෙරමුනක හවුල්කරුවකු වීමේ හැකියාවැති, එක්සත් ජාතික ප්‍රගතිශීලී සංධානයේ සාමාජිකත්වය දරන තෙලිඟු දේශම් පක්ෂය (ටීඩීපී) සමග සාකච්ඡාවකට සහ අර්ධ-සංධානයකට ප්‍රවිෂ්ට වී ඇත.ටීඩීපීය, සීපීඑම්හි සහයෝගය ලැබූ එක්සත් පෙරමුනු ආන්ඩුවේ මුඛ්‍ය හවුල්කරුවෙක් විය. එක්සත් පෙරමුන බලයෙන් ඇදවැටීමෙන් පසුව බීජේපීය සමග සංධානයකට එලැඹුනු ටීඩීපීය 1998 සිට 2004 දක්වා බීජේපී-නීත ආන්ඩුවට සහයෝගය දුන්නේ ය. ඒ අතර ම එය ආන්ද්‍රා ප්‍රදේශයේ ප්‍රාන්ත ආන්ඩුව තැනූ අතර එම ප්‍රාන්ත ආන්ඩුව ලෝක බැංකුවෙන් නිරන්තර ඉහල වර්නනා ලබමින් ඉන්දියාව පුරා නව-ලිබරල් ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමේ මුදුනේ සිටියේ ය.

එසේ වුවත් වර්ගෝත්තමවාදයට හා ජනතා විරෝධී ප්‍රතිසංස්කරනවලට එරෙහි අරගලයේ "සප්‍රතිපත්තික" සහායකයෙකු ලෙස ටීඩීපීය වැලඳගැනීමේ අභිලාෂයෙන් සීපීඑම් පසුවෙයි.

තව ද කොංග්‍රස් පක්ෂයේ යූපීඒ හවුල්කරුවන් සමග මැතිවරන ගිවිසුම් හා සංධාන ඇතිකරගැනීම සීපීඑම් විසින් නො තකා හැර නැත්තේ එම හවුල්කරුවන් වත්මන් ආන්ඩුවේ කොටස්කරුවන්ව සිටිද්දී ම ය.

ඊට වඩා වැදගත්කමෙන් අඩු නො වන්නක් වන්නේ බටහිර බෙංගාල ප්‍රාන්ත ආන්ඩුව විසින් ආයෝජක-හිතවාදී ප්‍රතිපත්ති ක්‍රියාවට දමනු ලැබීම සහ නන්දිග්‍රාම්හි ගොවිජන විරුද්ධත්වය ප්‍රචන්ඩ ලෙස මැඩීම ආරක්ෂා කිරීම ඇතුලත් "කාර්මීකරන" වැඩපිලිවෙලට සීපීඑම් සම්මේලනයේ අනුමැතිය ලැබීම යි.

කේරලයේ සීපීඑම්-නීත ආන්ඩුවට බටහිර බෙංගාල උදාහරනය අවධානයට ගෙන ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය ආකර්ෂනය කරගැනීම ඉලක්ක කරගත් පිලිවෙත් වෙනස්කිරීම් සමගින් වඩා යුහුසුලුව ඉදිරියට යන ලෙස උපදෙස් දෙනු ලැබ ඇති බව වාර්තා වේ.

පක්ෂයේ දේශපාලනික ආනුභාවය පිලිබඳව සීපීඑම් නායකත්වය පම්පෝරි ගැසුව ද නන්දිග්‍රාම්හි මර්දනයට එරෙහි වාමාංශික බුද්ධිමතුන්ගේ පුලුල් විරුද්ධත්වයේ සිට සීපීඑම් නායකයන් වඩ වඩා ඉන්දියානු සාම්ප්‍රදායික දේශපාලන ප්‍රභූව හැ බැඳුනු අපකීර්තිමත් හැසිරීම්වල යෙදෙන බව පිලිගත් පක්ෂයේ ම සංවිධාන වාර්තාව

දක්වා වැඩෙන අර්බුදය පිලිබඳ ගනන් නැති සලකුනු පවතී.

සංවිධාන වාර්තාවේ පිටපතක් රහසේ ලබා ගෙන තිබුනු *නිව් ඉන්දියන් එක්ස්ප්‍රස්* පුවත්පත මෙසේ සඳහන් කලේ යඃ "සමහර පක්ෂ ක්‍රියාකාරිකයෝ කුල සහ ආගමික භාවිතාවන් අනුගමනය කරති. සමහර පක්ෂ සාමාජිකයෝ දෑවැදි ක්‍රමය අනුගමනය කරන බවට චෝදනා පවතී. සමහර පක්ෂ සාමාජිකයෝ උපන්දින, විවාහ සහ නව නිවාස ගොඩනැගීම ආදියට අදාල පුහු අලංකාරික උත්සව සංවිධානය කරති."

"දූෂනය පක්ෂ නායකයන් අතරට ද මාවත් සොයාගෙන ඇතැයි යන්න ගැන පක්ෂය කනගාටු වේ. පක්ෂ නායකයන් සහ මහජන සංවිධාන නායකයන් ආදායම් සහ වත්කම් පිලිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු යයි පක්ෂය දැනට ම ත් උපදෙස් මාලාවක් නිකුත් කොට ඇත," යයි එම ලිපිය සංවිධාන වාර්තාව උපුටා දැක්වී ය.

පක්ෂයේ කේරල පුවත්පත්වලින් එකක් වන *දේශාභිමානී* හි කලමනාකරුවා ව්‍යාපාරිකයකුගෙන් ඉන්දියානු රුපියල් මිලියන 10ක (ඒ වනවිට එක්සත් ජනපද ඩොලර් 175,000ක් පමන) ගෙවීමක් ලබාගැනීම පිලිබඳව වාර්තාවේ සඳහන් විය.

පසුව පැවති මාධ්‍ය හමුවක දී බටහිර බෙංගාල මහ ඇමති බුද්ධාබෙබ් භටාචාර්ජි පක්ෂය "නිවැරදි කිරීමේ" උද්ඝෝෂනයක් ගොඩනංවන බව තහවුරු කලේ ය. " දේශපාලනය මුදල, මාංශ පේශී බලය සහ අපරාධකරනය වෙතින් නිදහස්ව තබා ගැනීමට අපට අවශ්‍ය ය," යයි භටාචාර්ජි පැවසී ය. සමාජවාදය වනාහි දුර ඈත අනාගතයට අයත් දෙයක් යයි ප්‍රකාශ කරමින් ටාටා සහ අනෙකුත් සංගත අධිපතීන් වෙත තමන් විසින් සම්මාන පුදනු ලැබීම පිලිබඳ විවේචන නො තකා හැර ඇති භටාචාර්ජිට පිලිගැනීමට නො හැකි දෙය වන්නේ මෙම දූෂනය වනාහි සීපීඑම් වඩ වඩා ධනේශ්වර සංස්ථාපිතයට ඒකාග්‍රවීමේ ප්‍රකාශනයක් පමනක් බව යි.

රටවල් 26කින් සීපීඑම් සම්මේලනයට පැමිනි සහෝදර නියෝජිතයින් 51 දෙනා ද එහි දේශපාලනික ගමන් මාවත පිලිබඳව බොහෝ දෑ හෙලිදරවු කරති.

ඔවුන් අතරට මෙම නොවැම්බරයේ පැවැත්වෙන මැතිවරනයේ දී ඩිමොක්‍රටික් පක්ෂයේ ජයග්‍රහනය සඳහා ප්‍රචාරයේ යෙදෙන එක්සත් ජනපද කොමියුනිස්ට් පක්ෂයේ සහ 1930 ගනන්වලින් මෙපිට එදා මෙදාතුර ප්‍රංශ ධනවාදයේ ගැලවීම සඳහා ඉදිරිපත්ව ඇත්තා වූ ද 2002 වර්ෂය තරම් මෑත දී කම්කරු පන්ති විරෝධී කර්කශ පියවර ක්‍රියාවට දැමූ ආන්ඩුවක සහකරුවන් වූ ද ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයෝ අයත් වූහ.

විශාලතම සහෝදර නියෝජිත කන්ඩායම ලෙස හයදෙනෙක් පැමිනියේ සීසීපී හෙවත් චීන කොමියුනිස්ට් පක්ෂයෙනි. චීන පාලක පක්ෂය, විදේශ ප්‍රාග්ධනයේ ද නැගීඑන චීන ධනේශ්වරයේ ද අවශ්‍යතා වෙනුවෙන් චීන කමැකරු පන්තිය අනුකම්පා විරහිත ලෙස මඩින ආඥාදායක තන්ත්‍රයක් පාලනය කිරීමේ යෙදී සිටී. ධනපතීන්ට පක්ෂයට ඇතුලුවීමට ඉඩලබා දීම සඳහා සීසීපීය මෑතක දී සිය ව්‍යවස්ථාව සංශෝධනය කලේ ය.

සීපීඑම්හි 19වන සමුලුවට එවූ සුභපැතුමේ දී සීසීපීය, සිය ඉන්දියානු සගයා "මාක්ස්වාදී න්‍යායන් ඉන්දියානු යථාර්ථයට ගලපාලීමට දරන දක්ෂ උත්සාහයන්" උත්කර්ෂයට නැංවී ය. සීපීඑම් තමන්ගේ පැත්තෙන් චීනය සමාජවාදී රටක් ලෙස වර්නනා කරන්නේ පසුගිය දශක තුන පුරා චීනය වර්ධනය කොට ඇති ආයෝජක-හිතවාදී ත්‍රන්තය සිය බටහිර බෙංගාල වාම පෙරමුනු ආන්ඩුවේ කාර්මීකරන වැඩපිලිවෙලේ මොඩලය ලෙස ගන්නා බව ප්‍රකාශ කරමිනි.